**උතුරු පළාතේ අභ්‍යන්තරිකව අවතැන්වී නැවත පදිංචි කරන ලද ජනතාවගේ ජීවනෝපාය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා පසු ගැටුම් ක්ෂණික සහාය ව්‍යාපෘතිය - 2014**

---

උතුරු පළාතේ අභ්‍යන්තරිකව අවතැන්වී නැවත පදිංචි කරන ලද ජනතාවගේ ජීවනෝපාය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා පසු ගැටුම් ක්ෂණික සහාය ව්‍යාපෘතියේ 2014 ජනවාරි 01 සිට පෙබරවාරි 28 දක්වා මාස 02 ක කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2010 සැප්තැම්බර් 27 දින එළඹි අංක ජේඑෆ්පීආර් - 9150 - එස්ආර්අයි දරන ප්‍රදාන ගිවිසුමේ 11 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ප්‍රදාන ගිවිසුම අනුව, එවකට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ ප්‍රතිපත්ති සැලසුම්, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර යාපනය, කිලිනොච්චි, මුලතිව්, මන්නාරම හා වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, උතුරු පළාතේ අභ්‍යන්තරිකව අවතැන්වී නැවත පදිංචි කරන ලද ජනතාව සඳහා තාවකාලිකව ආදායම් ඉපැයීමේ අවස්ථා සැලසීම මඟින් ඔවුන්ගේ ජීවනෝපායයන් ප්‍රතිස්ථානය කිරීමයි. ප්‍රදාන ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 2.79 ක් වන අතර එයින් එජඩො මිලියන 2.5 ක් එනම් ව්‍යාපෘතියේ මුළු පිරිවැයෙන් සියයට 89 ක් මූල්‍යායනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. එජඩො මිලියන 0.15 ක් හා එජඩො මිලියන 0.14 ක් වන ඉතිරි මුදල සඳහා පිළිවෙලින් ශ්‍රී ලංකා රජය හා ව්‍යාපෘති කාර්යයන් සඳහා සහභාගී වන ප්‍රජාව විසින් දායකවනු ලැබේ. ව්‍යාපෘති කාර්යයන් 2011 මැයි 01 දින ආරම්භ කර තිබුණු අතර 2013 ජුලි 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘතිය අවසන් කිරීමේ දිනය 2014 පෙබරවාරි 28 දක්වා දීර්ඝ කරන ලදී.

1.3 ව්‍යාපෘතියේ කාර්යයන්

---

ප්‍රදාන ගිවිසුම අනුව, ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වූ කාර්යයන් සාරාංශ කර පහත දැක්වේ.

| | | |
|---|---|---|
| ‘ඒ’ සංරචකය | - | කුඹුරු වාරි ඇළවල් හා ග්‍රාමීය ප්‍රවේශ මාර්ග පුනරුත්ථාපනය හා නඩත්තු කිරීම. |
| ‘බී’ සංරචකය | - | ස්වයං රැකියා සඳහා නිපුණතා සංවර්ධනය හා කෘෂිකාර්මික ඵලදායීතාවය වැඩිදියුණු කිරීම. |
| ‘සී’ සංරචකය | - | ව්‍යාපෘති පරිපාලනය, ක්‍රියාත්මක කිරීමේ සහාය, නියාමනය හා විගණනය |

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන  අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.5 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල  අවශ්‍යතාවන්ට  මම  අනුකූලවන  බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා  පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත් පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල  දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ප්‍රදාන සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදාන යටතේ මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

1.6 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම
----------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන
----------------

2.1 මතය
--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම හැර, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2014 පෙබරවාරි 28 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 පෙබරවාරි 28 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව සහ

(ඉ)	ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

2.2	මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්
------------------------------------------

2.2.1	ගිණුම්කරණ අඩුපාඩු
--------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ)	සේවක භාරකාර අරමුදල සඳහා කරන ලද රු. 343,035 ක් වූ වැඩිපුර ගෙවීම මූල්‍ය ප්‍රකාශනවල අවිනිශ්චිත ගිණුම යටතේ දක්වා තිබුණි.

(ආ)	ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදු වූ ගෙවිය යුතු හා ලැබිය යුතු මුදල් පිළිවෙලින් රු. 9,047,298 ක් හා රු. 742,924 ක් ගිණුම්ගත කර නොතිබුණි.

2.2.2	විගණනය සඳහා සාක්ෂි නොවීම
--------------------------------------

රු. 25,470,000 ක පිරිවැයකට 2014 ජනවාරි මාසයේදී ප්‍රසම්පාදනය කරන ලද “ කොම්බයින් හාවස්ටර්ස් ” 6 කට අදාළව ඒවා ප්‍රතිලාභීන්ට බෙදාහැරීම් ලැයිස්තු පිළිබඳ විස්තර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

2.2.3	නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.
-----------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ)	මුලතිව්, කිලිනොච්චි, වවුනියා, මන්නාරම හා යාපනය දිස්ත්‍රික්කවල ව්‍යාපෘතිය විසින් සිදු කරන ලද ජීවනෝපාය ප්‍රතිස්ථාපන කාර්යයන් යටතේ රු.29,377,755 ක් වටිනා මෙවලම් හා උපකරණ බෙදා දී තිබුණි. කෙසේ වුවද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධානවලට පටහැනිව එම වත්කම් ප්‍රසම්පාදනය කිරීම සඳහා ලංසුකරුවන් තෝරා ගෙන තිබුණි.

(ආ)	ව්‍යාපෘතිය විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් විධිමත්ව පවත්වා නොතිබුණි. තවද, මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව, දිස්ත්‍රික් කාර්යාල 05 ක ජංගම නොවන වත්කම් වලට අදාළව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදුකර නොතිබුණි. එබැවින්, දිස්ත්‍රික් කාර්යාලවලට බෙදා හරින ලද රු. 5,100,789 ක් වටිනා ජංගම නොවන වත්කම් හා රු. 29,377,755 ක් වටිනා මෙවලම් පිළිබඳ පැවැත්ම සත්‍යාපනය කර නොතිබුණි.

(ඇ)	උපදෙස් පරිදි, ව්‍යාපෘති කාලපරිච්ඡේදය අවසානයේදී මුදල් හා බැංකු ශේෂ මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතුය. කෙසේ වුවද එකතුව රු.1,020,436 ක් වූ මුදල් හා බැංකු ශේෂ 2014 පෙබරවාරි 28 දිනට මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර නොතිබුණි.

3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2014 පෙබරවාරි 28 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | 2014 වර්ෂය සඳහා අතිරේක වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | |
|---|---|---|---|---|---|---|
| | | | | 2014 වර්ෂය තුළ | 2014 පෙබරවාරි 28 දිනට | |
| | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන |
| ආ ස බැ | 2.50 | 320.90 | 55.00 | 27.87 | 2.44 | 320.26 |
| ශ්‍රී ලං ර | 0.15 | 19.20 | 1.50 | 0.38 | 0.04 | 5.70 |
| ප්‍රජා දායකත්වය | 0.14 | - | - | - | - | - |
| | 2.79 | 340.10 | 56.50 | 28.25 | 2.48 | 325.96 |

3.2 භෞතික කාර්යසාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති පරිපාලන ලියවිල්ලේ 15 ඡේදය ප්‍රකාරව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ සභාපතිත්වයෙන් ව්‍යාපෘති සම්බන්ධීකරණ කමිටුවක් (PCC) මාසිකව පැවැත්විය යුතුය. කෙසේ වුවද ව්‍යාපෘතියේ කාර්යයන් ඵලදායීව නියාමනය කිරීමට හැකිවන පරිදි ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළදී ව්‍යාපෘති සම්බන්ධීකරණ කමිටුවක් ස්ථාපිත කර නොතිබුණි.

(ආ) ඉටුකර ගත යුතු ඉලක්ක සමඟ ප්‍රධාන කාර්ය මණ්ඩලයේ වගකීම් සහ කාල පරිච්ඡේදය තුළදී සිදු කළ යුතු කාර්යයන් සම්බන්ධයෙන් අයවැය වෙන්කිරීම් හඳුනා ගැනීමට අවශ්‍ය වන ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. එබැවින් නිවැරදි කිරීම් ක්‍රියාමාර්ග ගැනීමට හා සකස් කරන ලද අරමුණු ඉටුකර ගැනීම සඳහා කළ යුතු අත්‍යවශ්‍ය වෙනස්කම් සිදු කිරීමට ව්‍යාපෘතියේ ප්‍රගතිය සමස්තයක් ලෙස විධිමත්ව ඇගයීම් කළ නොහැකි විය.

(ඇ) විගණනයට ලබාගත හැකි වූ තොරතුරු අනුව 2014 පෙබරවාරි 28 දිනට කුඹුරු වාරි ඇළ මාර්ග පුනරුත්ථාපනය කිරීම පිළිබඳ භෞතික ප්‍රගතිය පහත පරිදි වේ.

| දිස්ත්‍රික්කය | කුඹුරු වාරිමාර්ග ඇළ මාර්ග (FICS) | | | |
|---|---|---|---|---|
| | ඉලක්කය | නිමකරන ලද | කෙරීගෙන යන වැඩ | එකතුව |
| | (කි.මී.) | (කි.මී.) | (කි.මී.) | (කි.මී.) |
| යාපනය | 40 | 17.41 | - | 17.41 |
| කිලිනොච්චි | 40 | - | 22.5 | 22.5 |
| මුලතිව් | 40 | - | 7.25 | 7.25 |
| මන්නාරම | 40 | 18.90 | - | 18.90 |
| වවුනියා | 40 | - | 23.58 | 23.58 |
| එකතුව | 200 | 36.31 | 53.33 | 89.64 |

ඉහත තොරතුරු අනුව, ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළදී පුනරුත්ථාපනය කිරීම සඳහා ඉලක්ක කරන ලද කිලෝ මීටර් 200 කින්, කුඹුරු වාරිමාර්ග ඇළ මාර්ග කිලෝ මීටර් 36.31 ක් පමණක් ව්‍යාපෘති කාල පරිච්ඡේදය ඇතුළත නිම කර තිබුණි.

(ඇ) ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළදී ග්‍රාමීය ප්‍රවේශ මාර්ග කිලෝමීටර් 100 ක් වැඩිදියුණු කිරීමට ව්‍යාපෘතිය ඉලක්ක කර තිබූ නමුත්, ඉන් ග්‍රාමීය ප්‍රවේශ මාර්ග කිලෝ මීටර් 28.98 ක් පමණක් 2014 පෙබරවාරි 28 දිනට නිම කර තිබුණි.

(ඉ) ව්‍යාපෘති ගිවිසුම අනුව, අවම වශයෙන් අභ්‍යන්තරිකව අවතැන් වූ පුද්ගලයන් 2,000 ක් සඳහා කුසලතා සංවර්ධනය හා ස්වයං රැකියා පුහුණුව ලබා දීමට අපේක්ෂා කර තිබුණු නමුත් ඉන් අභ්‍යන්තරිකව අවතැන් වූ පුද්ගලයන් 1,758 කට පමණක් 2014 පෙබරවාරි 28 දිනට පුහුණු වැඩමුළු ලබා දී තිබුණි.

3.3 පරිබාහිර කටයුතු

2014 පෙබරවාරි 28 දින ව්‍යාපෘතිය විසින් රු.1,137,768 ක පිරිවැයකට ඩෙස්ක්ටොප් පරිගණක 10 ප්‍රසම්පාදනය කර තිබූ බවත්, එම පරිගණක එවකට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ පරිශ්‍රයේ 2014 දෙසැම්බර් 31 වන විටත් රඳවා තබා තිබුණු බව නිරීක්ෂණය විය.

3.4 ව්‍යාපෘතියේ කටයුතු වසා දැමීම

2014 පෙබරවාරි 28 දිනට ව්‍යාපෘතියේ කටයුතු වසා දමා තිබුණද ව්‍යාපෘතියේ වත්කම් අදාළ නියෝජිතායතනවලට භාරදී ව්‍යාපෘතියේ ගිණුම් වසා දැමීමට ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය විසින් කටයුතු කර නොතිබුණි.